# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2283/10 – 2022 ජුනි 06 වැනි සඳුදා – 2022.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මීතොටමුල්ල ( කොලොන්නාව නගර සහා සීමාව තුළ) ගමේ පිහිටි අංක 510 - මීතොටමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/KLN/2021/267 හා 2021.07.13 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර **'ඒ'** - වරිපනම් අංක 117/31 ඒ, මීතොටමුල්ල පාර - ප්‍රමාණය: හෙක්. 0.0081

උතුරට: හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම සහ ප්‍රවේශ මාර්ගය; නැගෙනහිරට: ප්‍රවේශ මාර්ගය සහ හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම; දකුණට: හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම සහ අගල; බටහිරට: අගල සහ හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම.

එස්.එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/5/2020/HW/277.
2022 පෙබරවාරි 16 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 05 - 0120



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*